රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 02/2021(VI)

මගේ අංකය : EST-6/03/LEA/3381
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2021.12.30

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**<u>රාජ්‍ය සේවය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් වූ 2021.10.01 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2021(V) කෙරෙහි අවධානය යොමු කරවමි.

02. 2022 වර්ෂය සඳහා විශාල මුදල් ප්‍රමාණයක් කෘෂිකාර්මික, කාර්මික, ජීවනෝපාය සංවර්ධන සහ යටිතල පහසුකම් සංවර්ධනය වැනි සංවර්ධන කටයුතු සඳහා රජය විසින් වෙන් කර ඇත. එම මුදල් මනාව කළමනාකරණය කර ගනිමින් සීඝ්‍ර සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා රාජ්‍ය සේවකයන්ගේ දායකත්වය ඉතා වැදගත් වේ. එය සැලකිල්ලට ගෙන කොවිඩ් - 19 වෛරස ව්‍යාප්තිය වැළැක්වීම සඳහා අනුගමනය කළ යුතු සෞඛ්‍ය මාර්ගෝපදේශ ඇතුළත් විධිවිධාන ඒ ආකාරයෙන් ම තිබිය දී, උක්ත චක්‍රලේඛයේ 02, 03, 04, 05, 06, 08 සහ 14 ඡේදයන්හි විධිවිධාන 2022.01.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවීමට තීරණය කර ඇත.

03. ඒ අනුව රාජ්‍ය නිලධරයන් 2022.01.03 දින සිට සාමාන්‍ය පරිදි සේවයට කැඳවීමට ක්‍රියා කළ යුතු ය.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය